සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

0032

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.................................................. විභාග අංකය:-..................................................

## I කොටස

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ස්නාවක ජොහාන් පිළිබඳ දිවැස්වැකි පැවසූ පරණ ගිවිසුමේ දිවැසිවරයෙක් වන්නේ,
   1. ජෙරමියා ය.
   2. යෙසායා ය.
   3. මතෙව් ය.
   4. සෙකරියස් ය.

02. ජේසුස් වහන්සේ දරුවන්ගේ ජීවිතවලින් දුටු ලක්ෂණ වන්නේ,
   1. අලංකාරත්වය හා වටිනාකම
   2. අසරණකම හා අයුක්තිය
   3. උදහස හා නොමඟ යෑම
   4. යටහත්කම හා කුරිරුකම

03. "ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතැනින් පහතට පනින්න." තෙවන පරීක්ෂාවට අදාළ ව මෙලෙස සඳහන් ව ඇති බයිබලයේ පොත් 2ක් වන්නේ,
   1. ලූක් හා මතෙව්
   2. මාක් හා ගීතාවලිය
   3. ලූක් හා ද්විතීය නීති සංග්‍රහය
   4. ලූක් හා ගීතාවලිය

04. ඔබගේ මවට පියාට භාරකරුවන්ට ඔබ, නොකළ යුත්තේ,
   1. උපකාරවන්ත විය යුතු ය.
   2. ප්‍රශ්න ඇති කළ යුතු ය.
   3. ප්‍රිය වචනයෙන් සංග්‍රහ කළ යුතු ය.
   4. කියන දේ අසන්නෙක් විය යුතු ය.

05. බයිබලයේ ක්‍රියා පොතේ සඳහන් ලොව පුරා සාගතය ඇති වන බව පැවසුවේ කුමන රජුගේ කාලයේ ද?
   1. සයිරස් රජු සමයේ ය.
   2. ක්ලෞඩිස් රජු සමයේ ය.
   3. බාල් රජු සමයේ ය.
   4. ආමෝස් රජු සමයේ ය.

06. ශ්‍රී ලංකා බයිබල් සමාගම පිහිටුවනු ලැබූ වර්ෂය හා ස්ථානය වන්නේ,
   1. 1612 දී බොරැල්ලේ ය.
   2. 1959 දී කොළඹ ය.
   3. 1812 දී කොළඹ ය.
   4. 1844 දී බොරැල්ලේ ය.

07. "ඇති හැමට වැඩියෙනුත්, දෙනු ලැබේ. නැති අයගෙන් ඇති දෙයත් ගනු ලැබේ." ජේසුස් වහන්සේ මෙසේ පැවසනු ලැබුවේ කුමන උපමාවෙන් පසුව ද?

1. වපුරන්නාගේ උපමාවෙන්
2. රන් කාසි දසය පිළිබඳ උපමාවෙන්
3. අකීකරු පුත්‍රයාගේ උපමාවෙන්
4. අබ ඇටයේ උපමාවෙන්

08. තෝමස් නම් ශ්‍රාවකයා ජේසුස් වහන්සේගේ උත්ථාන වීම පිළිගැනීමට සූදානම් වූයේ,

1. දැකීමෙන් පමණි.
2. ඇසීමෙන් හා ස්පර්ශයෙන් පමණි.
3. දැකීමෙන් හා ස්පර්ශයෙන් පමණි.
4. ස්පර්ශයෙන් හා ඇසීමෙන් පමණි.

09. සමාජය තුළ තිරසාර දේව ප්‍රේමය ඇතිව ක්‍රියා කළ යුත්තේ,

1. වැරදි කරන අයට සමාව දීමෙනි.
2. සියලු පාපයන් සහිතව ජීවිතය ගත කරමිනි.
3. රෝගීව දුක් සහිත ජීවිතයක් ගත කරමිනි.
4. අනුකම්පාව රහිතව සිටීමෙනි.

10. ජේසුස් වහන්සේ ශ්‍රාවකයින්ගේ පාද සේදීම සිදුවීමේ දී තම පාද සේදීමට ඉඩ නොදෙන බව පැවසුවේ,

1. සීමොන්
2. මාක් නම් ලත් ජොහාන්
3. සීමොන් පේදුරු
4. තිවුන්තා නම් ලත් තෝමස්

(ලකුණු 2 x 10 = 20)

- මෙම වගන්ති වැරදි නම් 'X' ලකුණ ද හරි නම් '✓' ලකුණ ද වරහන් තුළ යොදන්න.

01. ඒදන් උයනේ මිනිසාට ජීවත්වීමට සුදුසු වටාපිටාව ගොඩනගා තිබුණි. ( )

02. ලෝකයට, ලුණු හා ආලෝකය මෙන් තමාට පමණක් ජීවත් විය හැකි වට පිටාවක් ගොඩනැගීම අපගේ වගකීම ය. ( )

03. කමාව ලැබීමට නම් කමාව දානය නොකළ යුතු ය. ( )

04. ජේසුස් වහන්සේ දරුවන්ට ආදරය කරමින් "ස්වර්ග රාජ්‍ය මෙබඳු වන්නේ" යැයි පැවසී ය. ( )

05. "සියල්ල නිම විය." මෙය ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ පළමු වදනයි. ( )

06. ස්නාවක ජොහාන් පොළොංවංශය ලෙස හැඳින්වූයේ සද්දුසිවරු හා පරිසිවරුන්ව ය. ( )

07. "නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න." යැයි පැවසුවේ ස්නාවක ජොහාන් ය. ( )

08. ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ ග්‍රීක පිටපත සෙප්තුවාජින්ත නම් වේ. ( )

09. මුල් සභාවේ රොටි කැඩීමේ අවස්ථාව පසු කාලයේ දී ශුද්ධ සහභාගිකමේ පිළිවෙත පැවැත්වීම ලෙස හැඳින්විය. ( )

10. පුරාණයේ ජුදෙව් පෙන්ත කොස්ත මංගල්‍ය ජේසුස් වහන්සේගේ ජීවිත පූජාව සිහි කිරීමට පැවැත්වුණි. ( )

(ලකුණු 2 x 10 = 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තව ප්‍රශ්න 04ක් තෝරා පිළිතුරු සපයන්න.

(01) (i) දෙවියන් වහන්සේ මැවිල්ල තුළ මිනිසාට ලබා දුන් වගකීම් දෙකක් ලියන්න.

(ii) රන් අණ තුළින් කිතුනු ප්‍රේමය සවිමත් කරයි. රන් අණ ලියා දක්වන්න.

(iii) ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනයට පෙර අලුතින් ශ්‍රාවකයෙකු ලෙස තෝරා ගත් තැනැත්තා කවු ද?

(iv) රැළෙන් ඈතට සහ අකීකරු බැටළුවන් වෙනුවෙන් එඬේරා කුමක් සිදු කරයි ද?

(v) ඔබේ සතුරන්ට .......... කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා ......... කරන්න. මෙහි හිස් තැනට අදාළ වචන දක්වන්න.

(vi) "සභාව" යන්නට නිර්වචනයක් දක්වන්න.

(vii) 'මා සමඟ එක පැයක්වත් අවදිව ඉන්න බැරි වුණා ද? ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කුමන ස්ථානයේ දී ද, කා හට ද?

(viii) ස්නාවක ජොහාන්ගේ දූත මෙහෙයේ ඔප් නැංවුණු වැදගත්ම ගති ලක්ෂණය වන්නේ කුමක් ද?

(ix) දේව ගරු බිය සහිත ජීවිතයක් ගත කිරීමට ඔබ කළ යුතු දේවල් දෙකක් ලියන්න.

(x) අන්තිම රාත්‍රි භෝජනයේ "රොටි" තුළින් සංකේතවත් වූයේ කුමක් ද?

(ලකුණු 2 X 10 = 20)

(02) (i) ලුණු යමකට එක් කළ විට දියවේ. දියවීමෙන් එහි ප්‍රයෝජනය වැඩි වේ. මින් පෙන්නුම් කරන දේව රාජ්‍ය ගුණාංග 2ක් දක්වන්න. (ලකුණු 2)

(ii) මුළු පරිසරයම ආලෝකවත් කරවන, ආලෝක ප්‍රභව සේ ක්‍රියා කිරීමට සමිඳුන් අපව කැඳවයි. එසේ කියැවෙන ශු. මතෙව් 5:14 පදය දක්වන්න. (ලකුණු 3)

(iii) අන් අය ඔබට කෙසේ සලකනවාට ඔබ කැමති ද යන්න කරුණු 5කින් දක්වන්න. (ලකුණු 5)

(03) (i) පෙන්තකොස්ත දින සිදුවීම පුරාණ ගිවිසුමේ කුමන දිවැසිවර කීමක් ඉටු වීමක් ද? (ලකුණු 2)

(ii) පෙන්තකොස්ත දින දේශනය පැවැත්වූයේ කවරෙක් ද? (ලකුණු 3)

(iii) පෙන්තකොස්ත දින සිද්ධියේ අත්දැකීමට ඔබත් සිටියා යැයි සිතා, එදින සිද්ධිය විස්තර කරන්න. (ලකුණු 5)

(04) (i) යාච්ඤා කළ යුතු නිවැරදි ස්වරූප සේ ජේසුස් වහන්සේ පැවසූ කරුණු 02ක් දක්වන්න. (ලකුණු 2)

(ii) ජේසුස් වහන්සේ පැවසූ ලෙස වචන අසා පිළිපදින්නා කුමන නැණවතෙකුට සමාන ද? (ලකුණු 3)

(iii) ස්වාමීන් වහන්සේගේ යාච්ඤාවේ (මතෙව් 6:9-13) අප සමිඳුන්ගෙන් ඉල්ලන ඉල්ලීම් හා යුතුකම් විස්තර කරන්න. (ලකුණු 5)

(05) (i) නැති වූ බැටළුවාගේ උපමාවේ බැටළුවා හා එඬේරා ලෙස හඳුන්වන්නේ කවරෙක් ද? (ලකුණු 2)

(ii) රන් කාසි දසය පිළිබඳ උපමාවෙන් දේව රාජ්‍ය කවර ගුණාංගයක් ප්‍රකාශ කරයි ද? (ලකුණු 3)

(iii) සමාරිය ස්ත්‍රියට ජේසුස් වහන්සේ හමු වූ සිද්ධිය කෙටියෙන් දක්වා චිත්‍රයෙන් එම අවස්ථාව දක්වන්න. (ලකුණු 5)

(06) (i) ස්නාවක ජොහාන්ගේ දෙමාපියන් නම් කරන්න. (ලකුණු 2)

(ii) ස්නාවක ජොහාන්ගේ ජීවිතයේ නිහතමානී බව පෙන්නුම් කෙරෙන ප්‍රකාශයක් ලියන්න. (ලකුණු 3)

(iii) අද ඔබට පැමිණෙන පරීක්ෂා 3ක් හා ඉන් ඔබ ජය ගත් අන්දම දක්වන්න. (ලකුණු 5)

(07) මාතෘකා 02ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) දේව මැවිල්ල සුරකිමු.

(ii) චක්‍රාකාර දේව නිමැවුම්

(iii) දෙවියන් වහන්සේ අපේ පවුලට ආදරෙයි.

(iv) මේරි ජෝන්ස්

(v) අසල්වැසියාට ප්‍රේම කරමු. (ලකුණු 5 X 2 = 10)